**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් ලෙස රු.4,013,378 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වැඩියෙන් හඳුනාගෙන තිබුණි. | උපදෙස් පරිදි නිවැරදි කරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.234,799 ක ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. | ක්ෂයවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | වටිනාකම රු.9,376,932 ක් වු ලැබිය යුතු දැ වල අඩුවීම සමාලෝචිත වර්ෂයේ මුදල් ගලා ඒමක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. | උපදෙස් පරිදි කටයුතු කරන බව. | මුදල් ගලාඒම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ඈ) | වටිනාකම රු.4,317,768 ක් වු ගෙවිය යුතු දැ වල වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මුදල් ගලා ඒමක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | LDSP ව්‍යාපෘතිය යටතේ කහටගස්දිගිලිය සතිපොල නවීකරණය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සහතික කරන ලද රු.1,861,157 ක වැඩවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අවසන් බිල්පත් නොමැති බැවින් වත්කමක් ලෙස හඳුනා නොගත් බව. | වියදම් සහතික කර ඇති බැවින් ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ස්ථාවර තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය රු.185,397 ක් ලෙස වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලද ජල බවුසරයේ හා ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.14,620,209 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් තුළ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණි. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලාඒම සහ ගලායාම පමණක් දැක්විය යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් රු.568,253 ක වට්ටම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ලාභය තුළ මෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේද දක්වා තිබුණි. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නියමිත ස්ථානයේ පමණක් සඳහන් කළ යුතුය. |
| (එ) | වටිනාකම රු.8,611,272 ක්වූ හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු දැ හා හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබිය යුතු දැ යටතේ සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | සභාවේ ඇති මූල්‍ය ප්‍රකාශන පිටපතෙහි සඳහන්ව ඇති බව. | විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | සේවක ඇප තැන්පත් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනයේ සටහනක් තුළින් හෙළිදරව් කර නොතිබුණි. | හෙළිදරව් කිරීම පමණක් ප්‍රමාණවත් වේ. | සටහන් තුළින් විස්තර ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ.571 | 2009 සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළ රු.262,207 ක් ටෙන්ඩර් ඇප තැන්පතු 18 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | රාජ්‍ය ආදායමට ගැනීමට ක්‍රියාකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වැඩිකාලයක් භාවිතා නොකරන වටිනාකම රු.3,901,818ක් වූ වාහන 04 ක් සහ වටිනාකම රු.1,950,000 ක් වූ වාහන 06 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2017 ඔක්තෝබර් 31 දිනැති පළාත් පාලන චක්‍රලේඛ 14 වන වගන්තිය | වසර 03 කට වරක්වත් රජයේ තක්සේරුකරුවන්ගේ තක්සේරුව අනුව කුලිය සංශෝධනය කිරීම සහ වර්ෂයකට සියයට 05 ක අවමයකින් හෝ සභා තීරණ මත ඊට වැඩි ප්‍රමාණයකින් කුලිය වැඩිවන බවට වූ කොන්දේසි ගොඩනැගිලි බදු ගිවිසුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කළද වාර්තා ලැබී නැති බව. | පළාත් පාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.14,041,879 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම වියදම ඉක්ම වූ වියදම රු.7,583,201 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| (i) | වරිපනම් හා බදු | 2,263,184 | 2,166,906 | 2,082,208 | 2,151,947 | 2,362,584 | 2,173,731 | 1,464,592 | 2,067,249 |
| (ii) | කුලී | 16,973,465 | 10,959,518 | 10,578,749 | 4,387,970 | 16,556,023 | 11,703,392 | 9,298,421 | 4,007,201 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,051,200 | 885,754 | 885,754 | - | 710,050 | 719,628 | 719,628 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,378,225 | 7,201,191 | 6,355,817 | 4,326,233 | 6,572,443 | 4,850,824 | 4,850,824 | 3,480,859 |
| | | 28,666,074 | 21,213,369 | 19,902,528 | 10,866,150 | 26,201,100 | 19,447,575 | 16,333,465 | 9,555,309 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 2016 වර්ෂයේ තක්සේරුව අනුව වරිපනම් අයකිරීම සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.2,151,947 ක් විය. | නව තක්සේරුවක් ලබාගැනීම සඳහා ලිපි ඉදිරිපත් කර ඇති බව. | නව තක්සේරු ලබාගැනීම කඩිනම් කළ යුතුය. |
| (ii) | 2020, 2021 සහ 2022 වර්ෂවල දැන්වීම් පුවරු 49 ක් වෙනුවෙන් අයවිය යුතු මුදල රු.505,350 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කසළ බදු රු.501,578 ක් විය. | පිළිගන්නා බව. | -එම- |
| (ආ) | **කුලී** | | |
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් JCB යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට ලබාදීම වෙනුවෙන් වසර 02 ක කාලයක සිට සභිකයින්ගෙන් අයවිය යුතු රු.108,250 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද සභාව කටයුතු කර නොතිබුණි. | නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව. | නීතිමය කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,107,007 ක්වූ හිඟ කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.992,328 ක් හා මුද්දර ගාස්තු රු.1,871,600 ක් විය. | 2022 වර්ෂයේදී රු.2,776,584 ක් ප්‍රධාන ලේකම් වෙතින් ලැබී ඇති බව. | ගෙන්වා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ගවඝාතකාරගාර පවත්වාගෙන යාම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අගෝස්තු 23 දිනැති අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ අනුමත ගෝඝාතකාගාරවල ඝාතනය වන සතුන් පරීක්ෂා කිරීම සඳහා බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සභාවේ නිල සලකුණු භාවිතා කිරීම වෙනුවෙන් මස් කිලෝග්‍රෑම් 01 ක් සඳහා රු.10 බැගින් වූ ගාස්තුවක් අය කර නොතිබුණි. | 32 වන අතුරු ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය ලෙස නිවැරදි විය යුතු බව. | අතුරු ව්‍යවස්ථාවේ වගන්තිය ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර හා වාහන මුදල් අයකර ගැනීමකින් තොරව කුලියට ලබාදීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල් රු.218,242 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අගෝස්තු 12 දින සිට 21 දින දක්වා පැවති නිකිණිමේලා සැණකෙළියේ විනෝද අයිතම සඳහා සහභාගීවීම වෙනුවෙන් එක් අයෙකුගෙන් රු.300 ක් බැගින් ප්‍රවේශපත්‍ර නිකුත් කර තිබුණු නමුත් ඒ වෙනුවෙන් විනෝද බදු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සැනකෙළි භූමියට ඇතුල්වීමේදී ප්‍රවේශපත්‍රයක් නොමැති බැවින් විනෝද බදු අයකර නොමැති බව. | මෙහිදි විනෝද අයිතම් සඳහා සහභාගීවීම වෙනුවෙන් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර තිබුණු බැවින් එම ප්‍රවේශ පත්‍ර අලෙවිය මත විනෝද බදු අයවිය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
**පාරිසරික ගැටලු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සති පොල දිනයේ එකතුවන කසළ පමණක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදවා තිබුණු අතර ඉතිරි කසළ මධ්‍යස්ථාන අංගනයේ විවෘත භූමියේ ගිනිතැබීම හා වලදැමීම සිදුකරමින් පැවතුණි. | කිසිඳු ප්‍රයෝජනයකට ගත නොහැකි ද්‍රව්‍ය ගිනි දැමීම සහ වල දැමීම සිදු කරන බව. | පරිසරයට හානිදායක නොවන පරිදි නොදිරන කසළ බැහැර කිරීම සිදු කළ යුතුය. |